# පොලිස් ත්‍යාග අරමුදල

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණෙන් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන 2011 දෙසැම්බර් 31 දිනට පොලිස් ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් පවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොලිස් ත්‍යාග අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ මුදල් පදනම සහ උපචිත පදනම යන ක්‍රම 02 භාවිතා කරමිනි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී උසාවි දඩ මුදල් වශයෙන් ලද රු.2,882,520 ක් වටිනා අගරු වූ චෙක්පත මුදල් ගිණුමට බැර නොකොට, අගරු චෙක්පත් ගිණුමට බැරකර ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල දී ලෙජර් ගිණුම්වලට හර හා බැර කිරීම සඳහා යොදාගත් ජ`නල් සටහන් 28 ක් සඳහා කිසිදු වගකිව යුතු නිලධාරියෙකු විසින් අත්සන් කර නොතිබුණි.

#### 1.2.3 අවිනිශ්චිත ගිණුම

2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.48,929 ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂයක් පැවතුණි. එම අවිනිශ්චිත ගිණුමේ ශේෂය පැනනැගීමට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂය තුලදී ද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

#### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) රු.660,997 ක් වූ වගකීම් වර්ග 02 ක් වර්ෂ 06 කට වැඩි කාලයක් තුල බේරුම්කර නොතිබුණු බැවින් ඉදිරියේ දී එම වගකීම් බේරුම් කිරීමේ ඇති අවශ්‍යතාවය සැකසහිත බව නිරීක්ෂණය විය.

(ආ) පොලිස් අනුග්‍රහ අරමුදලට ලබා දී තිබුණු රු.2,000,000 ක් වූ අත්තිකාරම් මුදල සඳහා වර්ෂ 12 ක පමණ කාලයක් ගත වී තිබුණ ද එය නිරවුල් නොකිරීම නිසා එම මුදල් අයවීම සැක සහිත බව නිරීක්ෂණය විය.

(ඇ) රු.4,184,014 ක් වූ අත්තිකාරම් වර්ග 03 ක් ලබා දී වර්ෂ 11 ට වැඩි කාලයක් ගත වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල දී වියදමක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

1.2.5 **නීති, රීති රෙගුලාසි චක්‍රලේඛ යනාදියට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයට නිරීක්ෂණය විය.

| | නීති, රීති රෙගුලාසි චක්‍රලේඛ යනාදියට අනුකූල නොවීම | විස්තරය |
|---|---|---|
| (අ) | රජයේ මුදල් රෙගුලාසි (මු.රෙ)<br>මු.රෙ.395 (ඌ) | බැංකු සැසදුම් ප්‍රකාශ පිළියෙල කළ යුත්තේ එකතුවන මුදල් බැංකුවේ තැන්පත් කිරීම, චෙක්පත් ලිවීම හෝ මුදල් පොත පවත්වා ගැනීම ගැන කිසිම සම්බන්ධයක් නැති නිලධාරියකු හෝ නිලධාරීන් විසින්ම වුවත් එපරිදි ත්‍යාග අරමුදලේ කටයුතු සිදුකර නොතිබුණි. |
| (ආ) | චක්‍රලේඛ විධිවිධාන<br>2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2011 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සකස්කර නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය තුල දී අරමුදලේ කටයුතු වල මෙහෙයුම් ප්‍රතිඵලය රු.248,926,156 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.413,505,403 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.164,579,247 ක පිරිහීමක් වූ අතර එය පහත සඳහන් පරිදි විග්‍රහ කළ හැකිවේ.

| | 2011 | 2010 | ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට බලපෑම හිතකර / (අහිතකර) |
|---|---|---|---|
| | ------- | -------- | ----------------------- |

| | | | |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| <u>ආදායම</u> | | | |
| උසාවි දඩ මුදල් හා ආයෝජන ආදායම් | 818,302,753 | 850,892,579 | (32,589,826) |
| <u>වියදම</u> | | | |
| ත්‍යාග හා විනෝද කටයුතු | 564,658,750 | 437,246,226 | (127,412,524) |
| පරිපාලන වියදම් | 187,600 | 140,950 | (46,650) |
| වෙනත් වියදම් | 4,530,247 | - | (4,530,247) |
| මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම | | | (164,579,247) |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

රුපියල් මිලියන 150 ක ආසන්න මුදලක් වර්ෂය පුරා නිශ්කාර්යව බැංකු ජංගම ගිණුමක රඳවා තිබුණු අතර, අවශ්‍යතාවය නිවැරදිව පුරෝකථනය කරන ලද්දේ නම් අතිරික්ත මුදල 8% ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර රුපියල් මිලියන 12ක පොලී ආදායමක් ලබාගැනීමට හැකියාව තිබුණි.

4. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර කළමනාකරණය වෙත වාර්තා කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ලේඛන පැවැත්වීම

(ඇ) මාසික ගිණුම් සාරාංශ පිළියෙල කිරීම